## ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය - 2011

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) මණ්ඩලය පවත්වාගෙන ගිය පැරැණි ගොඩනැගිල්ල වෙනුවෙන් වූ කුලී ගිවිසුම 2011 සැප්තැම්බර් 30 දිනට අවසන් වී තිබුණද, ඊට අදාල එක් මසක ගොඩනැගිලි කුලී තැන්පතුව වූ රු.125,000 ක මුදලින නාගරික සංවර්ධන අධිකාරිය හා කොළඹ නගර සභාවට ගෙවිය යුතු රු.58,234 ක ශේෂය අඩුකර ගැනිමෙන් පසුව තවදුරටත් ලැබිය යුතු රු. 66,766 ක ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ.

(ආ) 2009 වර්ෂයේ සිට ලංකා පුවත් ආයතනයෙන් හා වෙනත් අයෙකුගෙන් ලැබිය යුතුව තිබුණ එකතුව රු.77,900 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ.

##### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගෙවීම් අවස්ථා 5 කට අදාල එකතු වටිනාකම රු. 277,409 ක් සඳහා ගෙවූ බවට සනාථ කල ලියකියවිලි, ලබාගත් බවට කුවිතාන්සි , මිල කැඳවීම් ආදි ලිඛිත සාක්ෂි නොමැති වීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

## 1.2.3 නිත රිතී හා රෙගුලාසි වලට අනුකුල නොවීම

නිත රිත , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නිත රිතී හා රෙගුලාස ආදියට යොමුව | අනුකුල නොවීම |
|---|---|
| (අ) 2010 මැයි 14 දිනැති ජනාධිපති ලේකම් කාර්යාලයේ සීඒ/1/17/1 දරන ලිපියේ 1 ජේදය | අමාත්‍යාංශ සහ ඒ යටතේ පවත්නා සියළුම ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හා රාජ්‍ය සංස්ථාවලට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යායුතු අතර, සුවිශේෂි තත්ත්වයන් යටතේ පමණක් පෞද්ගලික ගොඩනැගිලි ලබා ගැනීමට රජයේ තක්සේරුව අනුව අවසර ලබාගත යුතුව තිබුණ. කෙසේ වෙතත් 2011 දෙසැම්බර් 29 දින සිට මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන පෞද්ගලික අංශයට අයත් ගොඩනැගිල්ල කුලියට ගැනීම සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණ.<br><br>මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපතිවරයා පහත පරිදි අදහස් දක්වා තිබුණි.<br>“මණ්ඩලයට ගොඩනැගිල්ලක් සොයා ගැනීමට පුවත්පත් දැන්වීම් පළ කිරමට ප්‍රථම අමාත්‍යාංශය සමග සාකච්ජා කර රජයේ ගොඩනැගිල්ලක් සොයා ගැනීමට උත්සාහයේ යෙදුනි.නාගරික සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිලි තිබේද යන්න පරික්ෂාවට ලක්විය.එවැනි ගොඩනැගිල්ලක් නොතිබු හෙයින් පෞද්ගලික ගොඩනැගිල්ලක් ලබා ගැනිමට සිදුවිය.” |

## 1.2.4 ප්‍රමාණවත් අධිකාර් බලය නොලත් ගනුදෙනු

පහත සඳහන් නිරික්ෂණයන් කරණු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී නිකුත් කරන ලද රු.13,425,100 කට අදාල ජ'නල් සටහන් 42 ක් සඳහා නිසි අනුමැතිය සහිත ජ'නල් වවුචර් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ දී ආරම්භ කළ ජනසන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීමෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු.234,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනිමකින් තොරව ගිණුම් වලින් කපාහැර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩකටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 14,877,363 ක ඌණතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.14,000,000 ක ප්‍රදානයෙන් අනතුරුව එය රු.877,363 ක ඌණතාවයක් විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.13,445,045 ක ඌණතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 12,556,000 ක ප්‍රදානයෙන් අනතුරුව එය රු.889,045 ක ඌණතාවයක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,682 ක වර්ධනය සඳහා රජයේ ප්‍රදානය රු.1,444,000 කින් වැඩිවීම බලපා තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ස්ථාපිත කර ඇති මෙම මණ්ඩලය මගින් අපේක්ෂිත අරමුණු අතරින් වසර ගණනාවක සිට සිදුවනුයේ පුවත්පත් ලියාපදිංචිය පමණි. එසේ වුවද මෙම ආයතනය පවත්වාගෙන යෑම සඳහා සේවක පඩිනඩි වලට අමතරව සමාලෝචිත වර්ෂයේදී රු.5,431,396 ක වියදමක් දරා තිබුණ. එහෙත් පුවත්පත ලියා පදිංචියෙන් ලද ආදායම රු.61,350 කට සීමා වී තිබුණ.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ

(අ) 2011 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් ක්‍රියාකාරකම් 06 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණු අතර , පුවත්පත් කලාවේදී සංගම් ලියාපදිංචි කිරීම සඳහා වූ ක්‍රියාකාරකම, එක් සංගමයක් පමණක් ලියාපදිංචි කිරීමට සීමා වී තිබුණ.

මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපතිවරයා පහත පරිදි අදහස් දක්වා තිබුණි.

"අදාල ක්‍රියාකාරකම්ගෙන් බොහෝමයක් සිදු කරනුයේ දෙවන පාර්ශ්වයේ ඉල්ලීමට අනුවය.ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මගින් සිදු කරනු ලබන ඇතැම් කාර්යයන් වලට සමාන කාර්යයන් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සිදු කරයි.මේ වන විට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පුවත්පත් කලාවේදී සංගම් 100 කට අධික ප්‍රමාණයක් ලියාපදිංචි කර ඇත.විශාල සංගම් සංඛ්‍යාවක් මේ වන විට ලියාපදිංචි වී ඇති බැවින් නව සංගම් ලියාපදිංචි කිරීම පමණක් සිදු කරනු ලබයි."

(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකල අරමුණු

මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාළ පනතේ 8( 6) වන වගන්තියේ අනෙකුත් කරුණු වලට අමතරව පුවත්පත් භාවිතය හා පුවත්පත්වල අවශ්‍යතා පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, පොදු යහපත සඳහා ව අළුත් තත්ත්වයන් සමාලෝචනය කිරීම හා ඒවා සම්බන්ධයෙන් සුදුසු ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග යොජනා කිරීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණකි. මෙම අරමුණ ඉටුකිරීම සඳහා ආරම්භ කරන ලද පුවත්පත් ග්‍රාහක සමීක්ෂණය පූර්ව සංවිධාන කටයුතු වලට පමණක් සීමා වී තිබුණි.

## 3.2 කලමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාළ පනතේ 15 වන වගන්තියේ අනෙකුත් කරුණු වලට අමතරව අසත්‍ය, අපකීර්තිමත් සහ සදාචාරාත්මක නොවන කරුණු පුවත්පත්වල පළකිරීම වරදක් වන අතර, එවැනි වරදවල් කරනු ලබන්නන් දඬ වලට යටත් වේ. කෙසේ වෙතත් දිවයින තුළ පළකරනු ලබන මෙවැනි ප්‍රකාශන සම්බන්ධව සොයා බලා වරදකරුවන් අධිකරණය වෙත යොමුකරම සඳහා මණ්ඩලය තුළ පවත්නා යාන්ත්‍රණය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. මෙම ක්‍රියාවලිය සඳහා දැනට මණ්ඩලය තුළ සිටිනුයේ සිංහල මාධ්‍යයෙන් පමණක් පළවන ප්‍රකාශන සම්බන්ධව එක් විමර්ශන නිලධාරිනියක් පමණ.

මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපතිවරයා පහත පරිදි අදහස් දක්වා තිබුණි.

"මෙම පුවත්පත් අලෙවි වන පිටකොටුව, මරදාන සහ ආමර්වීදිය වැනි ස්ථානවලට ගොස් පුවත්පත් මිලදීගැනමේ දුෂ්කරතාවක් පවතී.එවැනි අවස්ථා වල මණ්ඩලයේ ප්‍රාථමික ශ්‍රේණියේ සිටින නිලධාරියෙක ඒ සඳහා යොදවා පුවත්පත් මිලදි ගැනීම සිදුකරනු ලැබේ".

(ආ) පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් පනවනු ලැබ ඇති නියෝගයන් අනුව අදාළ පුවත්පත්වල අයිතිකරුවන් විසින් ස්වකැමැත්තෙන් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම මත පමණක් ලියාපදිංචි කිරීම හා ඒ මත ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සලසා ඇත. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කරන ලද පුවත්පත් සංඛ්‍යාව 165 කට සීමා වී තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් 2010 වර්ෂයේ සිට ජනසංනිවේදන ඩිප්ලෝමා පාඨමාලා දෙකක් හා ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වාගෙන ගොස් තිබු අතර , ඒ ආශ්‍රිතව පහත කලමනාකරණ දුර්වලතාවයන් දක්නට ලැබුණි.

I සමාලෝචිත වර්ෂය තුලදී පාඨමාලා වෙනුවෙන් දරන ලද වියදම රු.823,655 ක් වන අතර, ආදායම රු.245,500 ක් වුයෙන් පාඨමාලා පැවැතවීමෙන් රු.578,155 ක් මණ්ඩලය විසින් දරා තිබුණී.

II 2011 මාර්තු 10 දින ආරම්භ කර, 2011 සැප්තැම්බර් 08 දින අවසන් කර ඇති ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 35 දෙනෙකු සහභාගි වී තිබු අතර , පාඨමාලා ගාස්තු ලෙස රු.525,000ක් අයවිය යුතු නමුත් රු.82,500 ක් පමණක් අයකර ගෙන තිබුණ.

3.3 අනාර්ථික ගනුදෙනු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) මිළ ගණන් කැඳවීමෙන් තොරව 2011 දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම සඳහා සැලසිනේ ආයතනයට භාරදී තිබු අතර , ඒ සඳහා රු.532,077 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) 2011 පෙබරවාරි මාසයේදී මහනුවර පැවැත්වීමට සැලසුම් කරන ලද ප්‍රාදේශීය මාධ්‍යවේදී වැඩමුළුව එදිනට පැවැත්වීමට නොහැකි බවට මහනුවර දිසත්‍රික් අතිරේක ලේකම් විසින් පුවත්පත් මණ්ඩලය වෙත දන්වා තිබියදීත්, ඒ පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව කටයුතු කිරීම නසා වැඩමුළු පැවැත්වීමෙන් තොරව රු.14,497 ක නිෂ්ඵල වියදමක් දරා තිබුණි.

3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාළ පනතේ 22 වගන්තිය ප්‍රකාර එහි ප්‍රධාන විධායක නිලධාරියා විය යුතු පුවත්පත් කොමසාරිස් තනතුරේ කටයුතු 2010 මාර්තු 31 දින සිට වරින් වර අමාත්‍යාංශයේ නිර්දේශ මත පත්කරනු ලැබු නිලධාරින් විසින් වැඩබැලීමේ පදනම මත ආවරණය

කර තිබුණි. මේ හේතුවෙන් පූර්ණ කාලීනව පැවතිය යුතු ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි තනතුර දීර්ඝ කාලයක් තිස්සේ වැඩබැලීමේ පදනම මත පැවතුණි. එසේම 2006 සැප්තැම්බර් 02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ප්‍රකාරව මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය පිළියෙල කර අනුමත කරවාගෙන නොතිබුණ අතර, මේ හේතුවෙන් ආරම්භයේ සිටම මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ ප්‍රධාන තනතුරු 6 ක් පුරප්පාඩුව පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 කළමනාකරණ මණ්ඩල සංයුතිය

මණ්ඩලය ස්ථාපිත කිරීමට අදාල 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 3 වන වගන්තිය ප්‍රකාර එහි අධ්‍යක්ෂ මණ්ඩලය පත කිරීම ආශ්‍රිතව පැනනැගි ඇති පහත සඳහන් ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය සංශෝධන ගෙන ඒමට පියවර ගෙන නොතිබුණ.

(අ) තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි නිරත මණ්ඩලයේ සාමාජිකයින් සඳහා කළමනාකරණය, මුදල් හා පරිපාලන රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානයන් පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති භාණ්ඩාගාර නියෝජිතයන් පත්කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන නොතිබීම.

(ආ) පනතේ 3 වන වගන්තියේ (ආ) ජේදයට අනුව ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් එක් තැනැත්තෙකු පුවත්පත් ව්‍යාපාරයේ සේවකයන්ගේ සම්බන්ධතා නියෝජනය කරන තැනැත්තෙකු විය යුතු අතර, ඒ සේවකයන්ගේ ලියාපදිංචි කළ එක් එක් වෘත්තීය සමිතිය විසින් නම් කරනු ලබන තිදෙනෙකුට නොවැඩි මුල මණ්ඩල වලින් ඔහු තෝරාගත යුතු වුවත්, එවැනි තැනැත්තෙකු ඉදිරිපත් නොවුයේ නම් එම පුරප්පාඩුව කෙසේ පුරවන්නේද යන්න පනතේ සඳහන්ව නොතිබීම.

## 4.2 ක්‍රියාකාර සැලැස්ම

2011 වර්ෂය වෙනුවෙන් මණ්ඩලය විසින් ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණද, ඒ ආශ්‍රිතව පහත දැක්වෙන දුර්වලතා දක්නට ලැබුණි.

(අ) ඉටු කිරීමට සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්හි භෞතික හා මූල්‍ය ඉලක්කයන් නියම කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් දැනට සක්‍රීය ලෙස දායකවී ඇති පැමිණිලි විභාග කිරීමේ ක්‍රියාකාරකම ක්‍රියාකාර සැලැස්මේ අන්තර්ගත වී නොතිබුණි.

(ඇ) එක් එක් ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන්නාවූ සම්පත්, අවශ්‍ය කාලයන් හඳුනාගෙන නොතිබණි.

ඉහත සඳහන් දුර්වලතා හේතුවෙන් ක්‍රියාකාර සැලැස්ම, මණ්ඩලයේ කාර්යසාධනය සැලසුම් කිරීම සඳහා වූ ඵලදායි යාන්ත්‍රණයක් ලෙස යොදාගත නොහැකි ව තිබුණි

4.3 කළමනාකරණ මණ්ඩලය විසින් ආයතනයේ කාර්යසාධනය අධීක්ෂණයට හා ඇගයීමට ලක් නොකිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 4.2.2 වගන්තිය ප්‍රකාරව ආයතනයේ තත්‍ය කාර්යසාධනය සැලසුම් කළ පරිදි ඉටුවන බව හා අවශ්‍ය ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගනු ලබන බව තහවුරු කර ගැනීම පිණිස මණ්ඩලය මගින් සංයුක්ත සැලැස්ම,අයවැය හා කාර්යසාධනය කාලීනව විමර්ශනයට ලක්කර නොතිබුණි.

4.4 අභ්‍යන්තර විගණනය

1998 අගෝස්තු 03 දිනැති අංක අයිඒඅයි/98/02 හා 2011 ජනවාරි 25 දිනැති අයිඒඅය /2011/01 යන භාණ්ඩාගාර චක්‍රලේඛන සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5)(ඇ) වගන්තිය ප්‍රකාර සමාලෝචිත වර්ෂය තුළද මණ්ඩලයේ කටයුතු හා ගණුදෙනු අභ්‍යන්තර විගණනයට ලක්කර වාර්තා කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

4.5 විගණන හා කලමනාකෙරණ කමිටු

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 7.4.1 ජේදය ප්‍රකාරව රාජ්‍ය ව්‍යවසායන්හි විගණන හා කළමනාකරණ කමිටු වසරකට අවම වශයෙන් 04 ක් වත් පැවැත්විය යුතු වුවත් , සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව දෙකකට සීමාවී තිබුණි.

4.6 ප්‍රසම්පාදන සැලැස්ම
------------------------

2006 ජනවාරි 25 දිනැති ජා.ප්‍ර.නි. චක්‍රලේඛ අංක 08 හි 4.21 ඡේදය ප්‍රකාර, මණ්ඩලයේ ප්‍රසම්පාදන කටයුතුවලදී ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය තහවුරු කර ගැනීමේ පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවක් ලෙස ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර, එදිනෙදා අවශ්‍ය වනු ලබන සැපයුම් හා සේවාවන් පූර්ව සැලසුම් කිරීමකින් තොරව ලබාගන්නා බව නිරීක්ෂණය විය.

4.7 අයවැය ලේඛන පාලනය
----------------------------

අයවැය ගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය
----------------------

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) දිස්ත්‍රික් මාධ්‍යවේදී වැඩමුළු හා ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම
(ආ) අත්තකාරම් පියවීම